# කුණු මල්ලෙන් මතුවූ ලිලීගේ වාසනාව



සනුති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

# කුණු මල්ලෙන් මතුවූ ලිලීගේ වාසනාව

සනුති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

(කතෘ)

කතෘගේ වෙනත් කෘති : හිතුවක්කාර ලියෝට පාඩමක් (2023)

ආඩම්බර මොණරාට පාඩමක් (2025)

මහාමායා බාලිකා විදුහල

6 –C ශ්‍රේණිය

2026.05.10

ISBN- 978-624-211-038-7

# පිදුම

මාගේ ආදරණීය දෙමාපියන්ටත්,

ගුරුමෑණිවරුන් සහ ගුරුපියවරුන්ටත්

මෙම පොත් පිංචය

සෙනෙහසින් යුතුව

පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදූකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදූහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක අම්මෙකුයි, තාත්තෙකුයි, ලිලී කියලා පුංචි ගැහැණු ළමයෙකුයි හිටියා. ඒ ළමයා හරිම සුරතල්. එයාගේ අමම්යි තාත්තයි එයාට හරිම ආදරෙයි. ලිලීගේ තාත්තා රැකියාවක් කළත් ඇයගේ අම්මා රැකියාවක් කළේ නෑ. උදේම රැකියාවකට යන තාත්තා සවස නිවසට එනතෙක් ලිලී මග බලාගන සිටියා. තාත්තාත් සවස එනවිට මොනවාහරි දෙයක් ලිලීට අරගෙන ඒමට පුරුදුව සිටියා. ලිලීගේ සුරතල් බලමින් එයාලා සතුටින් කාලය ගත කළා.



ඔහොම ටික කාලයක් ගත වුණා. ලිලීගේ තාත්තා හදිසියේම අසනීප වුණා. ලිලී තවම පොඩි ළමයෙක්. එයාට තාත්තා ගැන හරිම දුකයි. ලිලීගේ තාත්තට රැකියාවට යෑමට නොහැකි වුණා. ඒ නිසා එයාලට ගොඩක් අඟහිඟකම් ඇති වුණා. කන්න බොන්න අවශ්‍ය දේවල් ගන්නවත් සල්ලි නැති වුණා. සමහර වෙලාවට එයාලා බඩගින්නෙම දවස ගත කළා. ලිලීගේ අම්මා මොනවා හරි කුලී වැඩක් කරලා කීයක් හරි හොයා ගත්තා. ඒ මුදලින් බඩුටිකක් අරගෙන උයලා ලිලීටයි තාත්තටයි කන්න දුන්නා. ලිලීගේ අම්මා සමහරදාට බඩගින්නෙත් සිටියා.



ලිලීට දැන් වයස අවුරුදු පහයි. පාසල් යන්නත් ළගයි. එයා පාසල් යන්න ගොඩක් ආසාවෙන් හිටියේ. ඉතිං පාසල් යන දවස එන්න එන්නම ළං වුණා. ලිලීගේ වයසේ අනික් ළමයි පාසල් යන්න අළුත් පොත්, අළුත් සපත්තු , අළුත් බැග් ආදිය ගත්තා. ඒත් ලිලීට ඒවා අළුතින් අරන් දෙන්න එයාගේ අම්මට සල්ලි තිබුනේ නෑ. ඒ නිසා ලිලීට පාසල් යන්න එයාගේ අම්මා එයාට පරණ පොත්පත්, සපත්තු දෙකක් , බැග් එකක් හොයලා දුන්නා. ලිලී හරිම කැමැත්තෙන් පාසල් ගියා.




ඒත් සමහර වෙලාවට එයාගේ වයසේ අනික් ළමයි එයාට විහිලු කරා. එතකොට ලිලීට හොදටම දුක හිතුණා.

එයාලට කන්න බොන්නත් තාත්තට බෙහෙත් ගන්නත් සල්ලි තිබුණේ නැති නිසා ලිලීගේ අම්මට දිගටම ගෙවල්වල, වතුපිටිවල කුලී වැඩට යන්න සිද්ධ වුණා. මේ කුලී වැඩට යාමෙන් ලිලීගේ අම්මට  පොඩි මුදලක් ලැබුණා. ලිලී බොහෝ දවස්වලට ගෙදර ඉදන් තාත්තාව බලාගත්තා. ලිලීගේ තාත්තා ටික දවසකින් එයාලා දාලා යන්නම ගියා. ලිලීට ගොඩාක් දුක හිතුණා.



තාත්තා මියගියාට පසු ලිලීගේ මව ගෙවල්වල කුලී වැඩ කරමින් ලබාගත් සුළු මුදලින් ලිලීට කෑමබීම, ඇඳුම්

ගෙනත් දුන්නා. ඒ වගේම ගෙවල්වල වැඩපල කර ඉතා අසීරුවෙන් වුවත් සොයාගත් මුදලින් පාසල් යන්න අවශ්‍ය පොත්පත් මිලදී ගෙන අම්මා ලිලීව පාසල් යැවුවා. අඩු පාඩු ගොඩාක් තිබුණත් ලිලී හොඳින් ඉගෙන ගත්තා. ඒ නිසාම පාසලේ ගුරුවරු එයාට ගොඩාක් ආදරේ කළා. ඒ වගේම ලිලී එයාගේ අම්මටත් ගොඩාක් ආදරේ කළා. අම්මා වැඩ ඉවර කරලා හවස ගෙදර එනකොට ලිලී ගෙදර බොහෝ වැඩ අවසන් කරලා තිබුණා. අම්මා එනකම් එයා හැමදාම මග බලාගෙන හිටියා.



තාත්තා මිය ගිහින් මේ විදියට වසරක් පමණ ගතවුණා. ලිලීගේ මවත් හදිසියේම අසනීප වුණා. අම්මාට හරියට වැඩක්පලක් කර ගන්න බැරිවුණා. ඒ නිසා ලිලී ට හැමදාම පාසල් යන්නත් බැරි වුණා. ලිලී ගෙවල්වලට ගිහින් කෑම ඉල්ලුවා.  සමහර ගෙවල්වල පොඩි පොඩි වැඩ කළා. ඒවායින් ලිලීට පොඩි මුදලක් ලැබුණා. ඒ මුදලින් ලිලී  තමන්ගේ අම්මටයි එයාටයි කන්න කෑම ගෙනාවා. සමහර අවස්ථාවල කඩවලින් ඉතිරිවී කුණු කූඩවලට දමන  කෑම පවා ආහාරයට ගත්තා.



මේ විදියට ටික කාලයක් ගතවුණා. ලිලීගේ අම්මා හොඳටම රෝගී වුණා. හරිහැටි පෝෂ්‍යදායී ආහාරයක්වත් නොමැතිවීම නිසා ලිලීගේ අම්මා ටික කලකින් මියගියා. ලිලී මේ ලෝකේ තනිවුණා. එයාට කන්න අඳින්න දෙන්නවත් කවුරුත් නැති වුණා. එයා නිතරම එයාගේ අම්මයි, තාත්තයි සිහි කරමින් දුක් වුණා.



එක දවසක් ලිලී උදෙන්නම නැගිටලා වැඩක් හොයමින් පාර දිගේ ඇවිදගෙන ගියා. ඒත් එයා පොඩි ළමයෙක් නිසා කවුරුත් එයාව වැඩකට ගත්තේ නෑ. දැන් ලිලීට හොදටම බඩගිනියි. එයා කෑමක් ඉල්ලා ගන්න හිතාගෙන පාරෙ ඉස්සරහට ඇවිදගෙන ගියා. එයා එක පාරම දැක්කා පාර අයිනේ තියන කුණු ගොඩකට කාරයකින් පැමිණි කෙනෙක් කුණු මල්ලක් දානවා.



ලිලී දුවගෙන ගිහින් ඒ මල්ලේ කෑමට යමක් තියෙනවාද කියලා බැලුවා. කුණු මල්ල ඇතුලේ පෙට්ටියක් තිබුණා. ලිලී ඒක අතට අරන් ඇරලා බැලුවා. එකපාරම දුටු දෙයින් ලිලී පුදුමයට පත් වුණා. ඒ පෙට්ටිය ඇතුලේ රත්තරං බඩු ගොඩාක් තියෙනවා ලිලී දැක්කා. එයා ඒක

අරං කාර් එක ගිය පාරේ දිව්වා. ඒත් එයාට ඒක හොයා ගන්න බැරි වුණා. ලිලී ආපහු කුණු ගොඩ ලඟට ඇවිත් අර මල්ල පරීක්ෂා කරා.

ඒ මල්ල ඇතුලේ පරණ කොළ කෑලි ගොඩාක් තිබුණා. ලිලී ඒවා එකින් එක පරීක්ෂා කරලා බැලුවා. ඒක ඇතුලේ තිබුණු පරණ ලිපි කවරයක් ලිලී ට ලැබුණා. ඒකේ ලිපිනයක් තිබෙනවා ලිලී දැක්කා. එයා ඒක අරං ඒ ලිපිනය සොයා ගෙන ගියා. ලිලී කලින් දැක්ක කාර් එක ඒ ගෙදර තියෙනවා එයා දැක්කා. ඇය ඒ නිවසට ගොස් විස්තරය ඔවුන්ට කිව්වා. තමන්ගේ ගෙදර තිබුණු රත්තරං බඩු එහි නොමැති බව ඔවුන් තහවුරු කර ගත්තා. ඉන් පසු ලිලී රත්තරං බඩු නැවත ඔවුන්ට ලබා දුන්නා. ඔවුන් ලිලී ගැන ඉතාම පැහැදුනා.



ලිලී ගේ සියලු විස්තර ඔවුන් ලිලී ගෙන්අසා දැන ගත්තා. ඔවුන්ට ලිලී ගැන දුක හිතුණා. මේ තරුණ යුවලට දරුවන් සිටියේ නැහැ. ඒ නිසා එයාලා ලිලීව එයාලාගේ ගෙදර නතර කර ගත්තා. ඔවුන් ලිලීව පාසලකට ඇතුලත් කළා. තමන්ගේම දරුවෙක් විදිහට ඔවුන් ලිලීව හදා වඩා ගත්තා. ලිලී ඉතා හොඳින් අධ්‍යාපන කටයුතු කළා. ඒ වගේම ලිලී එයාලට කීකරුව, ගොඩාක් ආදරෙන් හිටියා. ලිලී දුප්පත් ළමයෙක් වුනත් එයා කාගෙවත් දෙයක් සොරකම් නොකල නිසා එයාට නැවත සතුටින් ඉන්න හැකි වුණා.

පුංචි අපිත් අනුන්ගේ දේවල් සොරකම් නොකරමින්, දෙමාපියන්ට ආදරයෙන් යහපත් ගතිගුණ ඇතිව, වැඩිහිටියන්ට ගෞරව කරමින් හොඳින් ඉගෙන ගැනීමට පුරුදු වෙමු.



නිමි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN ISBN- 978-624-211-038-7